**කෝරලේයිපත්තු උතුර ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 05 දිනද පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 16 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු උතුර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොතිබීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබිණි.

| විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 86,023,198 | ඉඩම් හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 786,500 | ස්ථාවර වත්කම් ලේඛන |
| ලී බඩු හා උපකරණ | 1,546,229 | ස්ථාවර වත්කම් ලේඛන |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.927,396 කි. ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 4,944,988 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(අ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ 2016 දෙසැම්බර් 31 දිනට පෙර නිම කළ යුතු, මාර්ග කොන්ක්‍රීට් කිරීම හා කාණු ඉදිකිරීමේ කටයුතු 2017 ජුනි 30 දින වන විටත් ආරම්භ කර නොතිබූ නමුත්, එම කර්මාන්ත සෑහීමට පත්විය හැකි අයුරින් නිම කළ බවට තාක්ෂණ නිලධාරී විසින් සහතික කිරීමෙන් පසුව එම අමාත්‍යාංශයෙන් 2016 දෙසැම්බර් 31 දින රු.550,585 ක මුදලක් ලබාගෙන තිබුණි.

(ආ) පොදු අරමුදල් ඵලදායීව භාවිතා කිරීමේ අරමුණෙන් පළාත් සභා සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වෙන්කරනු ලබන අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලබන කර්මාන්ත සඳහා දිගු කාලයක් ගතවන කාපට් කිරීම, කොන්ක්‍රීට් දැමීම හා තාර දැමීම් හැර බොරළු දැමීම් ආදි තාවකාලික මාර්ග ඉදිකිරීමේ කටයුතු සිදු නොකළ යුතු බවට 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ සඳහන් කර තිබුණත්, ඒ පිළිබඳව සැලකිල්ල යොමු නොකොට සමාලෝචිත වර්ෂයේ සභාව විසින් එක් මාර්ගයකට රු.429,565 ක වියදමින් බොරළු දමා තිබුණි.

(ඇ) 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අනියම් හා තාවකාලික පදනම මත බඳවා ගනු ලබන සේවකයින් වෙනුවෙන් සේවකයින්ගෙන් සියයට 8 ක දායක මුදලක් හා සේවායෝජකයාගෙන් සියයට 12 ක දායක මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යැවිය යුතුය. එසේ වුවත්, 2016 සහ 2017 වර්ෂවලදී පත්වීම් ලබාදුන් සේවකයින් 12 දෙනෙකු සඳහා එලෙස දායක මුදල් යවා නොතිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, අනියම් හා කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් බඳවා ගැනීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් පූර්ව අනුමැතිය ලබාගෙන නියමිත මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා වන අවසරය ලබාගැනීමෙන් අනතුරුව පමණක් සේවකයින් බඳවා ගත යුතු වුවත්, එලෙස පූර්ව අනුමැතිය සහ අවසරය ලබා ගැනීමකින් තොරව 2016 සහ 2017 වර්ෂවලදී සේවකයින් 18 දෙනෙකු අනියම් හා කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------------

### 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

-------------------------------------

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරනු ලැබූ විගණන ඡේදවලින් අනාවරණය කරනු ලැබූ ඌනතාවයන් සහ අඩුපාඩු සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | අන්තර්ගත විෂයය |
| --- | --- | --- |
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 2.2.3 (ආ) | ඇප මුදල් ලබාගත යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| 2015 | 3.2 (ආ) | දේපල මත වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| 2015 | 4.1(ආ) | පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වාහනවල අයිතිය මාරු කර නොතිබීම. |

**4.2 පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ලැබිය යුතු හා ගෙවිය යුතු දෑ ගිණුම්ගත කිරීම. |
| (ආ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |